# 10 ශ්‍රේණිය

# 13 - ජෛවලෝකය - 02

# විද්‍යාව



සැකසුම:
එල්.ගාමිණී ජයසූරිය මයා
ගුරු උපදේශක(විද්‍යාව)
වෙන්/කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය
ලුණුවිල



# ජෛව ලෝකය -02

## ජීවීන් වර්ගීකරණය හා නාමකරණය

# පෘෂ්ඨවංශීන්

- පෘෂ්ඨවංශී ජීවී කාණ්ඩවලට පොදුවූ ලක්ෂණ පහත ආකෘතියට දක්වන්න.

a. හෘදයේ කුටීර ගණන

b. ශ්වසන අවයව

c. චලතාපී ද/අචලතාපී ද

d. ප්‍රජනනය සදහා ඩිම්බ සංසේචනය වන ආකාරය

e. කාණ්ඩයේ පමණක් දැකිය හැකි ලක්ෂණ

f. වෙනත් ලක්ෂණ

- **පෘෂ්ඨවංශී ජීවී කාණ්ඩ** සම්බන්ධයෙන් පහත තොරතුරු සපයන්න.

| කාණ්ඩය | හෘදයේ කුටීර ගණන | ශ්වසන අවයවය | චලතාපී ද/ අචලතාපී ද | ප්‍රජනනය සඳහා ඩිම්බ සංසේචනය වන ආකාරය | කාණ්ඩයේ පමණක් දැකිය හැකි ලක්ෂණ | වෙනත් |
| --- | --- | --- | --- | --- | --- | --- |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

# පිස්කේස්



## i. පිස්කේස් කාණ්ඩයට පොදුවූ මූලික ලක්ෂණ

❖ හෘදයේ කුටීර ගණන

a. හෘදයේ කුටීර දෙකයි (කර්ණිකා එකයි කෝෂිකා එකයි)

❖ ශ්වසන අවයව

b. ශ්වසනය ජලක්ලෝම (කරමල් ) මගින් සිදු කරයි.

❖ චලතාපී ද/ අචලතාපී ද

c. චලතාපී වේ.

❖ ප්‍රජනනය සඳහා ඩිම්බ සංසේචනය වන ආකාරය

d. බාහිරව ඩිම්බ සංසේචනය සිදුවේ.

# වෙනත් ලක්ෂණ

e. අස්ථිමය හෝ කාටිලේජමය අභ්‍යන්තර සැකිල්ලක් දරයි.

f. දේහය අනාකූල හැඩතිය.

g. ඇසිපිය නොමැති ඇස් පිහිටයි.

## ii. පිස්කේස් කාණ්ඩයේ පමණක් දැකිය හැකි ලක්ෂණ

- දේහය කොරපොතු වලින් ආවරණය වී ඇත.

- පිහිනීම සඳහාත් සංතුලනය සඳහාත් වරල් පිහිටයි.

# iii. කරදියෙහි වෙසෙන ජීවියෙක්





ගිණිමහ

මුහුදු අශ්වයා



The Deep
An Aquarist Department Production
By Graham Hill -Science Officer
මුහුදු අශ්වයා
Male Seahorse
(*Hippocampus kuda*) Giving
Birth

# iv. මිරිදියෙහි වෙසෙන ජීවියෙක්



තිලාපියා


# මීකොං කැට්ෆිෂ්




# කාටිලේජමය මත්සයයින් සහා නිදසුන්



මෝරා



මඩුවා


mackerel
gurnard
www.visualdictionaryonline.com
lamprey
eel
swordfish

# ඇම්පිබියා

## i. ඇම්පිබියා කාණ්ඩයට පොදුවූ මූලික ලක්ෂණ

❖ හෘදයේ කුටීර ගණන

a. හෘදයේ කුටීර තුනයි (කර්ණිකා දෙකයි කෝෂිකා එකයි)

❖ ශ්වසන අවයව

b. පෙනහැලි, තෙත සම හෝ මුඛය මගින් ශ්වසනය සිදුකරයි.

❖ චලතාපී ද/ අචලතාපී ද

c. චලතාපී වේ.

❖ ප්‍රජනනය සඳහා ඩිම්බ සංසේචනය වන ආකාරය

d. බාහිරව ඩිම්බ සංසේචනය සිදුවේ.


# වෙනත් ලක්ෂණ

e. ග්‍රන්ථි සහිත තුනී සෙවලමය සමක් දරයි.

f. සංචරණය සඳහා පංචාංගුලික ගාත්‍රා පිහිටයි.

## ii. ඇම්පිබියා කාණ්ඩයේ පමණක් දැකිය හැකි ලක්ෂණ

- ජීවන චක්‍රය සම්පූර්ණ කර ගැනීමට ජලය අත්‍යවශ්‍ය වේ. (ජීවන චක්‍රයේ ජලජ අවධියක් ඇත)
- රූපාන්තරණයක් සහිත ය.


Oregon spotted frog
(*Rana pretiosa*)
South American caecilian
(*Siphonops annulatus*)
Dakota toad
(*Bufo hemiophrys*)
large-blotched salamander
(*Ensatina eschscholtzii*)

# iii.ජලයෙහි වෙසෙන ජීවියෙක්



South American caecilian
(*Siphonops annulatus*)



Oregon spotted frog
(*Rana pretiosa*)

මැඩියා

# iv. ගොඩබිම වෙසෙන ජීවියෙක්



Dakota toad
(*Bufo hemiophrys*)

ගෙම්බා



large-blotched salamander
(*Ensatina eschscholtzii*)

සලමන්දරා

# සලමන්දරා





# රෙප්ටීලියා

# i. රෙප්ටීලියා කාණ්ඩයට පොදුවූ මූලික ලක්ෂණ

❖ හෘදයේ කුටීර ගණන

a. හෘදයේ කුටීර තුනයි (කර්ණිකා දෙකක් හා අසම්පූර්ණ ලෙස බෙදුනු කෝෂිකාවක් ඇත.)

❖ ශ්වසන අවයව

b. පෙනහැලි මගින් ශ්වසනය සිදු කරයි.

❖ චලතාපී ද/ අචලතාපී ද

c. චලතාපී වේ.

❖ ප්‍රජනනය සඳහා ඩිම්බ සංසේචනය වන ආකාරය

d. අභ්‍යන්තරව ඩිම්බ සංසේචනය සිදුවේ.

# වෙනත් ලක්ෂණ

e. සංචරණය සඳහා පංචාංගුලික ගාත්‍රා පිහිටයි.

# ii. රෙප්ටීලියා කාණ්ඩයේ පමණක් දැකිය හැකි ලක්ෂණ

- ග්‍රන්ථිවලින් තොර වියළි සමක් දරයි. සම කොරල සහිත යි.



# iii. කරදියෙහි වෙසෙන ජීවියෙක්




iii. මිරිදියෙහි වෙසෙන ජීවියෙක්

# V. පාද රහිත ජීවියෙක්



## vi. ගොඩබිම වෙසෙන ජීවීන්



- උරගයින් සතුවන බොහෝ පොදු ලක්ෂණ පදනම් කර ගනිමින් වෙන් කළ හැකි උප කාණ්ඩ කිහිපයක් නම් කර,
- නිදසුන් ලෙස ජීවීන් සඳහන් කරන්න.

සර්පයින්

නයා, පොළඟා,ගැරඩියා, පිඹුරා

# සර්ප පෙරෙට්ටුව

Reptelia - Zoo



# කටුස්සන්

## කරුණාරත්නගේ අං කටුස්සා

## තොළ විසිතුරු කටුස්සා

## කරමල් කටුස්සා / සොඳුර

# ඉදිඹුවන්

## ගල් ඉබ්බා

## කිරි ඉබ්බා

## මේවර ඉබ්බා

# කැස්බෑවන්

## කණ්ණාඩි කැස්බෑවා

## වැලි කැස්බෑවා

## පොතු කැස්බෑවා

## මඩ කැස්බෑවා

# හූනන්

## මහ ගල් හූනා

## කිඹුල් හූනා

## පුල්ලි ගේ හූනා

# හිකනලුන්

චතුරංගුලි සර්ප හිකනලා

දරණියගලගේ සර්ප හිකනලා

ආනන්දලාගේ සිඟිති හිකනලා

# ආවේස්



Águia vs (lobo, homem, cobra, outros animais)
As Manobras Mais Incríveis de Águias

## i. ආවේස් කාණ්ඩයට පොදු වූ මූලික ලක්ෂණ

❖ හෘදයේ කුටීර ගණන

a. හෘදයේ කුටීර හතරයි (කර්ණිකා දෙකක් හා කෝෂිකා දෙකක්)

❖ ශ්වසන අවයව

b. පෙනහැලි මගින් ශ්වසනය සිදු කරයි.

❖ චලතාපී ද/ අචලතාපී ද

c. අචලතාපී වේ.

❖ ප්‍රජනනය සඳහා ඩිම්බ සංසේචනය වන ආකාරය

d. අභ්‍යන්තරව ඩිම්බ සංසේචනය සිදුවේ.

## වෙනත් ලක්ෂණ :

e. වාතයේ ගමන් කිරීම පහසු වන පරිදි දේහය අනාකූල හැඩයක් ගනී.

f. සංචරණය සඳහා පංචාංගුලික ගාත්‍රා පිහිටයි.

g. පූර්ව ගාත්‍රා පියාපත් බවට පත්වී ඇත.

h. ඇසිපිය සහිත, තියුණු දෘෂ්ටියක් ඇති ඇස් දරයි.

## ii. ආවේස් කාණ්ඩයේ පමණක් දැකිය හැකි ලක්ෂණ

- ඉතා සැහැල්ලු අස්ථිමය අභ්‍යන්තර සැකිල්ලක් දරයි.
- පිහාටුවලින් ආවරණය වූ සමක් දරයි.
- මුඛයේ දත් නොපිහිටයි. භෝජන රටාව අනුව සැකසුනු හොටක් සහිතය.



# iii. පියාපත් තිබුණද පියෑඹිය නොහැකි



කිවි




පැස්බරා


පෙන්ගුවින්


# iv. ජලයේ ජීවත්වන පක්ෂියෙකු





පෙන්ගුවින් හංසයා

# V. ජීවමාන විශාලතම පක්ෂියා



පැස්බරා

# vi.ජීවමාන කුඩාතම පක්ෂියා



ගුමන කුරුල්ලා

# මැමේලියා




Buddy Mays/Corbis

## i. මැමේලියා කාණ්ඩයට පොදුවූ මූලික ලක්ෂණ

❖ හෘදයේ කුටීර ගණන

a. හෘදයේ කුටීර හතරයි (කර්ණිකා දෙකක් හා කෝෂිකා දෙකක්)

❖ ශ්වසන අවයව

b. පෙනහැලි මගින් ශ්වසනය සිදු කරයි.

❖ චලතාපී ද/ අචලතාපී ද

c. අචලතාපී වේ.

❖ ප්‍රජනනය සඳහා ඩිම්බ සංසේචනය වන ආකාරය

d. අභ්‍යන්තරව ඩිම්බ සංසේචනය සිදුවේ.

## වෙනත් ලක්ෂණ :

e. රතු රුධිරාණු දරයි.

# ii. මැමේලියා කාණ්ඩයේ පමණක් දැකිය හැකි ලක්ෂණ

- රෝමවලින් ආවරණය වූ සමක් දරයි.
- බාහිර කන්පෙති දරයි.
- ස්තන ග්‍රන්ථි (කිරි නිපදවයි), සමෙහි ශ්වේද ග්‍රන්ථි (දහදිය නිපදවයි), ස්නේහස්‍රාවී ග්‍රන්ථි (සීබම් නිපදවයි) පිහිටයි.
- දේහයෙන් බාහිරව වෘෂණ කෝෂ පිහිටයි.
- කලල පටල විකසනය සිදු වේ. කලල බන්ධයක් සහිත ය.


# iii. කරදියෙහි වෙසෙන ජීවීන්



තල්මසා

# මුහුදු සිංහයා/ සීල් මත්සයයා සහ හිම වළසා

HD Clever Polar Bear Stalks Seal - Polar Bear Spy On The Ice, Preview - BBC OneHD Clever Polar Bear Stalks Seal - Polar Bear Spy On The Ice, Preview - BBC One



# iv. ගොඩබිම වෙසෙන ජීවියෙක්



# V. රුක්වැසි ජීවියෙක්




# vi. පියාඹන නමුත් පියාපත් නොමැති ජීවියෙක්



# වැම්පයර් වවුලා

World's Weirdest - Vampire Bats Edited



# vii. බිත්තර දමන, මවගෙන් කිරි උරා බී වැඩෙන



කුහුඹු බුදින්නා

# viii. පැටවුන් බිහි කරන නමුත් පැටවා වැඩෙන තුරු පැසක තබා ගන්නා ජීවියෙක්



- පෘෂ්ඨවංශීන් සම්බන්ධයෙන් පහත තොරතුරු සපයන්න.

| තොරතුර | පිස්කේස් | ඇම්පිබියා | රෙප්ටීලියා | ආවේස් | මැමේලියා |
|---|---|---|---|---|---|
| ද්විප්‍රස්තර ද? ත්‍රිප්‍රස්තර ද? | ත්‍රිප්‍රස්තර | ත්‍රිප්‍රස්තර | ත්‍රිප්‍රස්තර | ත්‍රිප්‍රස්තර | ත්‍රිප්‍රස්තර |
| හෘදයේ කුටීර ගණන කීයද? | දෙකයි | තුනයි | තුනයි කෝෂිකා අසම්පූර්ණයි | හතරයි | හතරයි |
| ශ්වසන අවයව මොනවා ද? | කරමල් | මුඛය, සම , පෙනහැලි | පෙනහැලි | පෙනහැලි | පෙනහැලි |
| චලතාපී ද? අචලතාපීද? | චලතාපී | චලතාපී | චලතාපී | අචලතාපී | අචලතාපී |

# ජීවීන් නාමකරණය

# ජීවීන් නාමකරණයේදී අනුගමනය කළ යුතු පියවර

- ජීවියා හඳුන්වන නම ලතින් භාෂාවෙන් හා ඉංග්‍රීසි අකුරු වලින් ලිවීම.

- ජීවියා හඳුන්වන නම ගණ නාමය හා සුළු නාමය ලෙස කොටස් දෙකකින් යුතු වීම.

- ගණ නාමයේ පළමු අකුර පමණක් ඉංග්‍රීසි කැපිටල් අකුරු වලින් ලිවීම. අනෙක් අකුරු ඉංග්‍රීසි සිම්පල් අකුරු වලින් ලිවීම.
- මුද්‍රණය කරන්නේ නම් ඉංග්‍රීසි ඇල අකුරු භාවිත කිරීම.
- අතින් ලියන්නේ නම් ගණ නාමය හා සුළු නාමය යටින් ඉරක් ඇඳීම.

# ජාතික පුෂ්පය



*Nymphea stellata*

<u>Nymphea</u> <u>stellata</u>

# ශ්‍රී ලංකාවට ආවේණික ජීවීන්

# කොටගමගේ කුරු ගෙම්බා




Calotes ceylonensis (Painted-lip Lizard)
Pallegama, Sri Lanka.
කරුණාරත්නගේ අං කටුස්සා
© Ruchira Somaweera
Department of Zoology, University of Peradeniya, Sri Lanka.


අසෝක පෙතියා
Puntius asoka


*Puntius bandula*
බන්ධුල පෝතයා


අසංකගේ පඳුරු මැඩියා
Philautus asankai

# ජෛව ලෝකය -02

# ජීවීන් වර්ගීකරණය හා නාමකරණය

YES ! I CAN



# ස්තුතියි !

සැකසුම:
එල්.ගාමිණි ජයසූරිය මයා
ගුරු උපදේශක(විද්‍යාව)
වෙන්/කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය
ලුණුවිල